අයිතිය උදෙසා මාධ්‍යවේදියෝ
உரிமைகளுக்கான ஊடகவியலாளர்கள்
JOURNALISTS FOR RIGHTS

4/71, Thalakotuwa Gradens,
Colombo 05

**Tele/Fax : 011 2669100**

මාධ්‍ය නිවේදනයයි

පාර්ලිමේන්තු වරප්‍රසාද නීතිය අවභාවිත කරමින් මාධ්‍යවේදීන් දඩයම් කිරීමට ගන්නා උත්සාහය දැඩිව හෙළා දකිමු!

පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක විසින් කරන ලද පැමිණිල්ලකට අනුව, බීබීසී සිංහල සේවයේ කර්තෘ ඉෂාරා ධනසේකර සහ මාධ්‍යවේදී සම්පත් දිසානායක යන මහත්ම මහත්මීන් එළඹෙන ජූලි 23 වැනිදා පාර්ලිමේන්තු වරප්‍රසාද කාරක සභාව හමුවට කැඳවීමට ගත් උත්සාහය 'අයිතිය උදෙසා මාධ්‍යවේදියෝ' සංවිධානය ලෙස අපි දැඩි සේ හෙළා දකිමු. සමාජ විරෝධය හමුවේ එම තීරණය වෙනස් කර මෙම කැඳවීම නැවැත්වීමට පාර්ලිමේන්තු වරප්‍රසාද කමිටුව තීරණය කර ඇති බවට ඇතැම් ආරංචිමාර්ග වාර්තා කළද, මාධ්‍ය ආයතනයක් වරප්‍රසාද කමිටුවට කැඳවීමට ගත් මෙම උත්සාහය අතිශය ගැටලු සහගත වන අතර, ඉදිරියේදී වෙනත් මාධ්‍යවේදීන් ද මෙලෙස කැඳවීමේ සාධාරණ සැකයක් හා අවදානමක් පවතී.

**නෛතික පදනමක් නොමැති කැඳවීමක්**

මෙම කැඳවීම සඳහා කිසිදු නෛතික පදනමක් ද නොමැත. පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය යනු පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග යටතේ ස්ථාපිත කළ නිල කාරක සභාවක් නොවේ. පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනත ක්‍රියාත්මක වන්නේ පාර්ලිමේන්තුවේ සභා ගර්භයේ කටයුතුවලට සහ නිල කාරක සභාවලට පමණක් වන බැවින්, මෙලෙස මාධ්‍යවේදීන්ට තර්ජනය කිරීම සම්පූර්ණයෙන්ම අත්තනෝමතික ක්‍රියාවකි.

1953 අංක 21 දරන පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතෙහි මූලික අරමුණු වූයේ, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ගේ නිදහස, විශේෂයෙන්ම සභා ගර්භය තුළ සිවිල් හෝ අපරාධ චෝදනාවලට ලක් නොවී භාෂණයේ සහ විවාද කිරීමේ නිදහස ආරක්ෂා කිරීමයි. මුල් යුගයේදී මෙම නීතිය යොදාගනු ලැබුවේ මන්ත්‍රීවරයෙකුට සිය කටයුතු බියකින් තොරව කරගෙන යාමට අවශ්‍ය පරිසරය නිර්මාණය කිරීමට පමණි. එහෙත් 1978 දී සහ ඉන් පසු ගෙන ආ සංශෝධන හරහා පාර්ලිමේන්තුවටම අධිකරණමය බලතල (Quasi-judicial powers) පවරා ගන්නා ලදී.

මෙම සංශෝධන හරහා පනතට ඇතුළත් කළ උප ලේඛනයේ ඒ කොටසේ (Part A) 5, 6 සහ 7 වගන්ති මගින් පිළිවෙළින් දක්වා ඇත්තේ, පාර්ලිමේන්තුවේ හෝ යම් කාරක සභාවක සිදුවූ විවාදයක් හෝ කටයුත්තක් පිළිබඳව සිතාමතාම අසත්‍ය වූ හෝ විකෘති කරන ලද (false or perverted) යම් වාර්තාවක් පළ කිරීම, මන්ත්‍රීවරයෙකු විසින් පවත්වන ලද කතාවක් සම්බන්ධයෙන් එවැනි අසත්‍ය හෝ විකෘති කළ වාර්තාවක් පළ කිරීම සහ පාර්ලිමේන්තුවේ කටයුතු හෝ එහි කීර්තියට හානි වන අන්දමේ අපහාසාත්මක ප්‍රකාශයක් පළ කිරීම යන කරුණු පාර්ලිමේන්තු වරප්‍රසාද කඩකිරීමක් ලෙස සලකා දඬුවම් නියම කළ හැකි බරපතළ වැරදි වන බවයි. ඒ අනුව පාර්ලිමේන්තුවට විනිශ්චයකාරවරයෙකු ලෙස ක්‍රියා කරමින් මාධ්‍යවේදීන් ඇතුළු පුරවැසියන් කැඳවීමටත්, ඔවුන්ට දඩ පැනවීමට හෝ සිරගත කිරීමටත් බලය හිමිවිය. මෙය නීතියේ ආධිපත්‍යය මෙන්ම ස්වාභාවික යුක්තියේ මූලධර්ම ද මුළුමනින්ම උල්ලංඝනය කිරීමකි. එහෙත්, මෙම අත්තනෝමතික නෛතික ප්‍රතිපාදනද අවභාවිත කරමින්, නිල බලයක්ද නොමැති

අයිතිය උදෙසා මාධ්‍යවේදියෝ
உரிமைகளுக்கான ஊடகவியலாளர்கள்
JOURNALISTS FOR RIGHTS

4/71, Thalakotuwa Gradens,
Colombo 05

Tele/Fax : 011 2669100

මන්ත්‍රීවරියන්ගේ සංසදයක තොරතුරු වාර්තා කළ මාධ්‍යවේදීන්ගෙන් පළිගැනීමට උත්සාහ කිරීම අතිශය අත්තනෝමතික ක්‍රියාවක් බව අපගේ විශ්වාසයයි.

**ඉතිහාසයේ කළු පැල්ලම්: වරප්‍රසාද නීතියෙන් මාධ්‍ය දඬුවම් කිරීම**

පාර්ලිමේන්තුව අධිකරණයක් (Quasi-judicial) ලෙස ක්‍රියාකරමින් දේශපාලඥයන්ට පැමිණිලිකරු, නඩු පවරන්නා සහ විනිසුරු යන භූමිකා තුනම එකවර නිරූපණය කිරීමට අවස්ථාව ලැබුණි.

1. හැරල්ඩ් පීරිස් මහතාගේ සිදුවීම: ජනාධිපති නීතිඥ සාලිය පීරිස් මහතා පෙන්වා දෙන පරිදි, 1978 වසරේ මෙම පනත සංශෝධනය කළ පසු ඔහුගේ පියා වූ 'සිලෝන් ඔබ්සර්වර්' (Ceylon Observer) පුවත්පතේ එවකට කර්තෘ හැරල්ඩ් පීරිස් මහතා එමගින් වරදකරුවකු කරන ලදි. පුවත්පතේ පිටු සැකසීමේදී අත්වැරදීමකින් ප්‍රභූවරයෙකුගේ ඡායාරූපයකට වැරදි ශීර්ෂ පාඨයක් (Caption) මුද්‍රණය වීම මුල්කරගෙන ඔහුව ජාතික රාජ්‍ය සභාව වෙත කැඳවනු ලැබීය. නිසි අධිකරණමය ක්‍රියාවලියකින් තොරව, විත්තිකරුවන්ට සාධාරණ නඩු විභාගයකට ඇති අයිතිය අහිමි කරමින් දේශපාලඥයන් විසින්ම ඔවුන්ට දඩ මුදලක් නියම කරන ලදී.

2. වික්ටර් අයිවන් සහ රනිල් වික්‍රමසිංහ ගැටුම (1992): 1992 සැප්තැම්බර් මාසයේදී 'රාවය' පුවත්පතේ "වොක්සි බොරු කියයි" යනුවෙන් පළවූ ප්‍රවෘත්තියක් සම්බන්ධයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී කේ. එන්. චොක්සි වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කළේය. ඒ අනුව රාවය කර්තෘ වික්ටර් අයිවන් මහතාව වරප්‍රසාද කමිටුවට කැඳවනු ලැබීය. එකල වරප්‍රසාද කමිටුවේ සභාපතිවරයා වූයේ රනිල් වික්‍රමසිංහ මහතාය. එහිදී වික්ටර් අයිවන් මහතා අනුගමනය කළේ සුවිශේෂී උපායමාර්ගයකි. ඔහු කමිටුව හමුවේ යටහත් පහත් නොවී, කමිටුවට නඩු ඇසීමට ඇති නෛතික පටිපාටිය තියුණු ලෙස ප්‍රශ්න කළේය. "පැමිණිලිකරුගෙන් හෝ සාක්ෂිකරුවන්ගෙන් හරස් ප්‍රශ්න ඇසීමට විත්ති පක්ෂයට අයිතියක් තිබේද?", "නීතිඥ සහාය ලබාගත හැකිද?", "අධිකරණයක් ලෙස ක්‍රියාකිරීමට කමිටුවට ඇති නියමිත ක්‍රියාපටිපාටිය කුමක්ද?" යන ප්‍රශ්න ඔහු විසින් මතු කළේය. රනිල් වික්‍රමසිංහ ඇතුළු කමිටුවට මෙම මූලික නෛතික ප්‍රශ්නවලට පිළිතුරු දීමට නොහැකි වූ අතර, එම නිසාම එම වරප්‍රසාද චෝදනාව ඉන් ඔබ්බට ගෙන යාමට කමිටුව අපොහොසත් විය.

**ජාත්‍යන්තර ප්‍රවණතාව සහ ශ්‍රී ලංකාවේ පසුගාමීත්වය**

ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු සම්ප්‍රදායට මූලික වූ එංගලන්තයේ වෙස්ට්මිනිස්ටර් ක්‍රමය තුළ පවා, පාර්ලිමේන්තු වරප්‍රසාද කඩකිරීමක් සම්බන්ධයෙන් මාධ්‍යවේදීන්ට දඬුවම් කිරීම (Penal jurisdiction) 20 වැනි සියවසේ මැද භාගයේ සිට භාවිතයෙන් ඉවත් කර ඇත. ඔවුහු මාධ්‍ය නිදහස සහ ස්වයං-නියාමනය කෙරෙහි දැඩි විශ්වාසයක් තබති. ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 105 සහ 194 වගන්ති යටතේ පාර්ලිමේන්තුවට සහ ප්‍රාන්ත සභාවලට වරප්‍රසාද හිමිවුවද, ඉන්දීය ශ්‍රේෂ්ඨාධිකරණය අවස්ථා ගණනාවක දී අවධාරණය කර ඇත්තේ අදහස් ප්‍රකාශ කිරීමේ මූලික අයිතිවාසිකම පාර්ලිමේන්තු වරප්‍රසාදවලට යටත් කළ නොහැකි බවයි. එහෙත් ශ්‍රී ලංකාවේ දේශපාලඥයින් තවමත් මෙම නීතිය පළිහක් කරගෙන මාධ්‍ය දඬයමේ යෙදෙයි.

අයිතිය උදෙසා මාධ්‍යවේදියෝ
உரிமைகளுக்கான ஊடகவியலாளர்கள்
JOURNALISTS FOR RIGHTS

4/71, Thalakotuwa Gradens,
Colombo 05

**Tele/Fax : 011 2669100**

**නීතිය සංශෝධනය කිරීමේ අතීත උත්සාහයන්**

මාධ්‍ය සංවිධාන දශක ගණනාවක් තිස්සේ කළ අරගලවල ප්‍රතිඵලයක් ලෙස 2019 නොවැම්බර් 05 වැනි දින පැවති කැබිනට් මණ්ඩලයේදී මෙම 1953 අංක 21 දරන පාර්ලිමේන්තු පනත සංශෝධනය කිරීම සඳහා අග්‍රාමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාවකට අනුමැතිය හිමි වී එය ගැසට් කිරීමටත් තීරණය විය. එහෙත් දේශපාලන බල පෙරළි හමුවේ එම ප්‍රගතිශීලී පියවර කිසිදා යථාර්ථයක් නොවීය.

පාර්ලිමේන්තු වරප්‍රසාද නීතිය යනු පාර්ලිමේන්තුවේ කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යාමට ඇති පළිහක් මිස, සමාජය, මාධ්‍ය හෝ අධිකරණය මර්දනය කිරීමට දේශපාලඥයන්ට ලබා දී ඇති කඩුවක් නොවේ. හැරල්ඩ් පීරිස්ගේ සිට වික්ටර් අයිවන් දක්වාත්, වර්තමාන BBC මාධ්‍යවේදීන් දක්වාත් දිවෙන මෙම අඳුරු ඉතිහාසය ඔප්පු කරන්නේ, ව්‍යවස්ථාදායකයට අධිකරණ බලතල ලබා දීමෙන් ස්වභාවික යුක්තියේ මූලධර්ම (Principles of Natural Justice) අහිමි වන බවයි.

ප්‍රජාතන්ත්‍රවාදය සහ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස ආරක්ෂා කිරීමට නම්, යල්පැන ගිය පාර්ලිමේන්තු බලතල හා වරප්‍රසාද පනතේ ඇති මාධ්‍යවේදීන්ට සහ පුරවැසියන්ට දඬුවම් කළ හැකි ඒකාධිපති ප්‍රතිපාදන වහාම සංශෝධනය කළ යුතුව ඇත. එසේ නොමැතිව ප්‍රවෘත්තියකට උරණ වී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට (CID) දිවීම හෝ වරප්‍රසාද කමිටුව හමුවට මාධ්‍යවේදීන් දක්කාගෙන යාම ශිෂ්ට සම්පන්න ප්‍රජාතන්ත්‍රවාදී සමාජයකට කිසිසේත්ම නොගැලපේ.

**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍ය ගරු නලින්ද ජයතිස්ස මහතා වෙත:**

ගරු අමාත්‍යතුමනි, ජනමාධ්‍ය අමාත්‍යවරයා ලෙස මෙරට මාධ්‍ය නිදහස සහ මාධ්‍යවේදීන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ මූලික වගකීම ඔබතුමා සතු වේ. එසේම, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා ලෙස, ආණ්ඩු පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුන් මෙවැනි පදනම් විරහිත, ප්‍රජාතන්ත්‍ර විරෝධී සහ රජය අපකීර්තියට පත්කරන ක්‍රියාවලින් වළක්වා ගැනීමේ දැවැන්ත වගකීමක් ද ඔබතුමාට ඇත.

එබැවින්, කිසිදු නෛතික පදනමක් නොමැතිව ජනමාධ්‍ය නිදහසට බරපතළ සීමා ඇතිකරන මෙම අත්තනෝමතික කැඳවීම වහාම අත්හිටුවීමට අවශ්‍ය මැදිහත්වීම සිදුකරන ලෙසත්, මාධ්‍යවේදීන්ට බියකින් හෝ තර්ජනයකින් තොරව තම වෘත්තීය කටයුතු කරගෙන යාමට අවශ්‍ය වටපිටාව තහවුරු කර දෙන ලෙසත් අපි ඔබතුමාගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිමු.

අවසාන වශයෙන්, මාධ්‍ය මර්දනයට තෝතැන්නක් වූ මෙම ඒකාධිපති පාර්ලිමේන්තු වරප්‍රසාද නීතිය සංශෝධනය කිරීමේ අවශ්‍යතාව පිළිබඳව මෙරට සියලුම මාධ්‍ය සංවිධාන සහ සිවිල් ව්‍යාපාර ගෙන යන උද්දේශන ව්‍යාපාරය සමග 'අයිතිය උදෙසා මාධ්‍යවේදියෝ' ලෙස අප ද කොන්දේසි විරහිතව එක්වන බව මෙයින් අවධාරණය කරමු.

**අයිතිය උදෙසා මාධ්‍යවේදියෝ (Journalists for Rights)**